VERITÉ RESEARCH
Strategic Analysis for Asia

# සංක්ෂිප්ත සටහන

## ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණයට නිවැරදි වාර්තාකරණයේ වැදගත්කම

චීන ණය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්

2021 පෙබරවාරි

# ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණයට නිවැරදි වාර්තාකරණයේ වැදගත්කම
# චීන ණය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්

**වෙරිටේ රිසර්ච් ආයතනය**

**2021 පෙබරවාරි**

මෙම අධ්‍යයනය, **වෙරිටේ රිසර්ච්** ආයතනයේ ආර්ථික විද්‍යා පර්යේෂණ කණ්ඩායම විසින් සම්පාදනය කරන ලද්දකි. නිශාන් ද මෙල්, සුභාෂිනි අබේසිංහ, මතීෂ අරංගල යන සාමාජිකයන්ගෙන් එම කණ්ඩායම සමන්විත විය. මේ සඳහා අවශ්‍ය වූ සංස්කරණ සහය ලබා දෙන ලද්දේ හස්නා මුනාස් විසිනි.

© 2021 Verité Research Pvt Ltd. සියළු හිමිකම් ඇවිරිණි

ISBN 978-624-5514-03-8

නිර්දේශිත උද්‍ධෘතය: වෙරිටේ රිසර්ච් ආයතනය (2021). ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණයට නිවැරදි වාර්තාකරණයේ වැදගත්කම - චීන ණය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්. කොළඹ: වෙරිටේ රිසර්ච් ආයතනය

ප්‍රමුඛ පද: ණය වාර්තාකරණය, රාජ්‍ය මූල්‍ය, රාජ්‍ය විදේශ ණය, රාජ්‍ය සංස්ථා ණය

අනෙකුත් පර්යේෂණයන් භාගත කරගැනීමට:
https://www.veriteresearch.org/publication_type/research-briefs/

ඔබේ අදහස් විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න ඵ publications@veriteresearch.org

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ගමන් ගන්නා දිශාව දිනෙන් දින අයහපත් අතට හැරෙමින් පවතී. මෙම අභියෝගයට මුහුණ දීමට නම්, රටෙහි ණය තත්ත්වය පිළිබඳව නිවැරදි තොරතුරු වාර්තා කිරීම මෙන්ම නිවැරදි ලෙස ණය කලමනාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වැදගත්ය.

කෙසේ වෙතත්, මෙම ණය කළමනාකරණයට උපකාරී වීම සඳහා සකස්කර ඇති ක්‍රියාදාමයන් හා ගෙන ඇති පියවරයන් ආරම්භයේදීම තොරතුරු ආශ්‍රිත ගැටළුවකට මුහුණ පායි. දැනට ප්‍රකාශිතව පවතින දත්ත මගින් ශ්‍රී ලංකාවේ ණය බර සහ එකී ණය විදේශ ණය දෙන්නන් අතර බෙදී යන ආකාරය නිවැරදිව නිරූපණය නොවේ. ලංකාවේ වත්මන් විදේශ ණය පිළිබඳ තොරතුරු වාර්තාකරණය මධ්‍යම රජයේ විදේශ ණය පිළිබඳ විස්තර වලට පමණක් සිමා වී තිබීම මෙයට හේතුවයි. එම වාර්තාකරණය තුල රාජ්‍ය සංස්ථා වැනි වෙනත් රාජ්‍ය ආයතන විදේශ වලින් ගත් ණය අන්තර්ගත නොවේ.

මෙම සංෂිප්ත සටහනෙන් පෙන්වා දෙන්නේ ණය වාර්තාකරණයේදී මධ්‍යම රජයේ ආයතන වලින් පරිබාහිරව ඇති රාජ්‍ය ආයතනවල විදේශ ණය ඊට ඇතුලත් කිරීමට අපොහොසත් වීම ලංකාවේ ණය බර අවතක්සේරුවට හේතු වන බවයි. මෙයට හේතුපාදක වන එම තොරතුරුමය ගැටළුව කොටස් තුනක් ඔස්සේ මෙහිදී පැහැදිලි කර ඇත. රාජ්‍ය විදේශ ණය සහ මධ්‍යම රජයේ විදේශ ණය අතර වෙනස පළමු කොටස තුළින් කෙටියෙන් දැක්වේ. දෙවන කොටසෙන් රාජ්‍ය විදේශ ණය සංයුතිය පිළිබඳව වාර්තාකරණය සම්බන්ධ තොරතුරු ගැටලුව චීන ණය උදාහරණයක් ලෙස ගනිමින් පැහැදිලි කරයි. මධ්‍යම රජයේ ගිණුම් වල ඇති ණය රාජ්‍ය සංස්ථාවල ගිණුම් වලට විතැන් කිරීමෙන් විදේශ ණය පිලිබඳ දත්ත වෙනස්කිරීමට හැකියාවක් ඇති බව තුන්වෙනි කොටසෙන් පෙන්වා දෙයි. අවසාන කොටසින් අවධාරණය කරන්නේ ලංකාවේ ණය බර නිවැරදි ලෙස පිළිබිඹු වන ආකාරයට ණය තොරතුරු වාර්තාකරණය වැඩි දියුණු කිරීමේ ඇති තීරණාත්මක වැදගත්කමයි.

## 2. රාජ්‍ය විදේශ ණය ප්‍රමාණය, මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණයට වඩා විශාලය

ශ්‍රී ලංකා මහ බැංකුව මධ්‍යම රජයේ විදේශ ණය සංයුතිය ප්‍රකාශයට පත් කරයි. කෙසේ වෙතත්, මෙය සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණයෙන් එක් කොටසක් පමණකි. මෙහිදී සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය යනු , ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය විසින් විදේශ පාර්ශ්වයන්ගෙන් ලබාගෙන ඇති, ශ්‍රී ලංකාවේ මහජනතාව වගකිව යුතු මුළු ණය ප්‍රමාණයයි.

රාජ්‍ය අංශයේ ණය ගණනය කිරීම සඳහා වූ සම්මත නිර්වචනයට (i) මධ්‍යම ආණ්ඩුව (ii) මහ බැංකුව සහ (iii) රාජ්‍ය අංශයේ සංස්ථා (රජයට අයත් බැංකු වැනි තැන්පතු භාරගන්නා ආයතන හා රාජ්‍ය සංස්ථා ද) අන්තර්ගත වේ.[1]

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රජයේ මූල්‍ය වාර්තා මගින් ණය ලබා ගන්නා ආයතන හෝ ණය ලබා දෙන ආයතනවල රාජ්‍ය විදේශ ණය සංයුතිය සම්බන්ධ පැහැදිලි චිත්‍රයක් ලබා දීමක් සිදු නොවේ. මෙම තොරතුරු ඌනතාවය නිසා සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය පිළිබඳ නිවැරදි ප්‍රතිරූපය මහජනයාගෙන් වසන් වීමක් සිදු වේ. ලංකාවේ ණය කළමනාකරණයට සහ එහි ස්වභාවය අවබෝධ කරගැනීමට ගන්නා ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වය අඩාල කිරීමට සැබෑ ණය ප්‍රමාණය පිළිබඳව පැහැදිලි අදහසක් නොමැති වීම හේතුවක් විය හැකිය.

## 3. සිද්ධි අධ්‍යයනයඃ චීනයට ඇති ණය අවතක්සේරු කිරීම

චීන රජයේ ආයතනවලින් (මින් ඉදිරියට චීනය ලෙස හැඳින්වෙන) ලබාගෙන ඇති ණය පිළිබඳව වන වාර්තාකරණයන් මෙම ගැටළුව සඳහා කදිම නිදසුනකි. මහ බැංකුව විසින් ප්‍රකාශිත දත්ත සලකා බලන්නෙකු 2019 වසරේදී ශ්‍රී ලංකාව විසින් චීනයට ගෙවිය යුතු සමස්ත ණය ප්‍රමාණය ඇ.ඩො. මිලියන 3,387 ක් (රු. බිලියන 615) වෙතැයි නිගමනයකට එළැඹීමට ඉඩ ඇත.[2] මෙය ශ්‍රී ලංකා මධ්‍යම රජය ලබා ගෙන තිබුණු මුළු

---

[1] IMF, ‘External Debt Statistics – Guide for compilers and users’, 2014, available at: http://tffs.org/pdf/edsg/ft2014.pdf, [අවසන් වතාවට ප්‍රවේශය 03 අප්‍රේල් 2020].


[2] 2019 වසර අවසානයේදී පැවැති ශ්‍රී ලං. රු. 181.63ඃ ඇ.ඩො. 1 යන විනිමය අනුපාතිකය ඇසුරින් පරිවර්තනය කරන ලදි.

විදේශ ණය ප්‍රමාණයෙන් 10% කට සමාන විය.[3] කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රජයේ හිමිකාරත්වය යටතේ පවතින රාජ්‍ය සංස්ථා විසින් චීනයෙන් ලබාගෙන තිබුණු ණය ප්‍රමාණය එම දත්ත වලට ඇතුලත් කර නොමැත.

1 සහ 2 රූප සටහන්වලින් දැක්වෙන පරිදි 2019 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය සංස්ථා විසින් චීනයෙන් ලබාගෙන තිබුණු ණය ප්‍රමාණය ඇ.ඩො. මිලියන 3,042 ක් (රු. බිලියන 371 ක්) විය.[4] මෙම ණය ප්‍රමාණය සැලකිල්ලට ගත් කල ශ්‍රී ලංකා රජය චීනයෙන් ලබාගෙන තිබුණු සමස්ත විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. මිලියන 5,429 (රු. බිලියන 986) දක්වා 60% කින් ඉහළ යයි.[5]

රාජ්‍ය සංස්ථා විසින් ලබාගෙන ඇති රාජ්‍ය ණය නිසි පරිදි වාර්තා කිරීමට අසමත් වීම ශ්‍රී ලංකාවේ සැබෑ ණය වගකීම් සැලකිය යුතු අවතක්සේරුවකට ලක් වීමට හේතු වී ඇති බව මෙම නිදර්ශනයෙන් පෙන්නුම් කෙරේ.

*රූප සටහන 1 : ශ්‍රී ලංකා රජය 2019 වන විට චීනයෙන් ලබාගෙන ඇති ඇස්තමේන්තු කල ණය (ඇ.ඩො. මිලියනවලින්)*




*මූලාශ්‍ර : 2019 මහ බැංකු වාර්ෂික වාර්තාව සහ 2019 මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාව*

ශ්‍රී ලංකාව විසින් ලබාගෙන ඇති විදේශ ණයවලින් විශාල ප්‍රමාණයක් මධ්‍යම රජයෙන් පරිබාහිරව රාජ්‍ය සංස්ථා විසින් ලබාගත් ණය ලෙස පවතින බවද එමගින් පෙන්නුම් කෙරේ. ණය ගෙවීමේදී ඉස්මතු වන ගැටළු රාජ්‍ය සංස්ථා විසින් ලබාගෙන ඇති ණය (වාර්තාගත නොවූ) සහ මධ්‍යම රජයේ ණය (වාර්තාගතව ඇති) ගෙවීමේදී මතු වන ගැටළුවලින් වෙනස් නොවේ. මේ නිසා, මධ්‍යම රජය විසින් ලබාගෙන ඇති විදේශ ණය පමණක් වාර්තා කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ණය තත්ත්වය හා එහි ස්වාභාවය සම්බන්ධයෙන් නොමග යවන සුළු චිත්‍රයක් මවා පායි.

### *3.1 නොමග යවන සුළු ණය වාර්තාකරණයට ඇති ඉඩ කඩ*

ණය වගකීම් පිළිබඳ සැබෑ තොරතුරු මහජනතාවගෙන් වසන් කිරීමටද ණයෙහි ස්වභාවය පිළිබඳ නොමග යවන සුළු චිත්‍රයක් මැවීමටද ණය වාර්තාකරණයේ ඇති දුර්වලතා රජයට අවස්ථාවක් සලසා දෙයි. රාජ්‍ය සංස්ථා ලබාගෙන ඇති ණය ලැයිස්තුවක් දෙවෙනි රූප සටහනින් දැක්වේ. එම ලයිස්තුවේ දැක්වෙන නිදසුන් යොදාගෙන මෙම කරුණ වඩාත් හොඳින් පැහැදිලි කළ හැක.

[3] ශ්‍රී ලංකා මහ බැංකුව, 'මහ බැංකු වාර්ෂික වාර්තාව 2019', 115 වගුව, 2020. ලබාගත හැකි සබැඳිය: https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/annual-reports/annual-report-2019, [අවසන් වතාවට ප්‍රවේශය 21 සැප්තැම්බර් 2020].
[4] 2019 වසර අවසානයේදී පැවැති ශ්‍රී ලං. රු. 181.63: ඇ.ඩො. 1 යන විනිමය අනුපාතිකය ඇසුරින් පරිවර්තනය කරන ලදී.
[5] 2019 වසර අවසානයේදී පැවැති ශ්‍රී ලං. රු. 181.63: ඇ.ඩො. 1 යන විනිමය අනුපාතිකය ඇසුරින් පරිවර්තනය කරන ලදී.

*රූප සටහන 2: රාජ්‍ය සංස්ථා චීනයෙන් ලබාගෙන ඇති ණය*

| ව්‍යාපෘති ණය | ණය ලබා දුන් ආයතනය | ණය ලබාගත් ආයතනය | නොපියවූ වටිනාකම (ඇ.ඩො.මි)[1] |
|---|---|---|---|
| රාජ්‍ය සංස්ථා චීන එක්සිම් බැංකුවෙන්[2] ලබාගෙන ඇති ව්‍යාපෘති ණය (මුදල් අමාත්‍යාංශ ඇපකර ලැයිස්තුවේ නොදැක්වෙන මධ්‍යම රජය විසින් අදාළ රාජ්‍ය සංස්ථා වෙත විතැන් කර ඇති ණය)[3] | | | |
| පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය | The Export-Import Bank of China | ලංකා විදුලිබල මණ්ඩලය | 828 |
| හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය | The Export-Import Bank of China | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 951 |
| මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ව්‍යාපෘතිය | The Export-Import Bank of China | ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 123 |
| **එකතුව** | | | **1,902[4]** |
| රාජ්‍ය සංස්ථා චීනයෙන් ලබාගෙන ඇති, මුදල් අමාත්‍යාංශයේ ඇපකාර ලැයිස්තුවෙහි දැක්වෙන මහා භාණ්ඩාගාරයේ ඇපකාරත්වය සහිත ව්‍යාපෘති ණය | | | |
| බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය | Industrial and Commercial Bank of China Limited | ලංකා විදුලිබල මණ්ඩලය | 23.1 |
| කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපෘතිය | The Export-Import Bank of China | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම | 40.7 |
| - | China Development Bank Corporation | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 48.8 |
| - | China Development Bank Corporation | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 13.7 |
| - | China National Chemical Engineering No.14 Construction Co. Ltd | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 13.5 |
| **එකතුව** | | | **140** |
| **මුළු එකතුව (රාජ්‍ය සංස්ථා චීනයට ගෙවිය යුතු මුළු ණය)** | | | **2,042** |

*[1] මෙහි දක්වා ඇති නොපියවූ ණය වටිනාකම් 2019 දෙසැම්බර් 31 දිනට පැවැති අගයයන්ය.*
*[2] මහ බැංකුව වාර්ෂික වාර්තාව 2019 හි 6 පරිච්ඡේදයේ 6.9 වගුවෙන් ලබා ගන්නා ලදී*
*[3] මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාව 2017 - සටහන 28(ඹ) - විදේශ ණය ශේෂ ප්‍රකාශනයට අනුව*
*[4] 2019 වසර අවසානයේදී පැවැති ශ්‍රී ලං. රු. 181.63: ඇ.ඩො. 1 යන විනිමය අනුපාතිකය ඇසුරින් පරිවර්තනය කරන ලදී.*
*මූලාශ්‍රය: මහ බැංකු වාර්ෂික වාර්තාව 2019 සහ මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාව 2019*

මධ්‍යම රජයේ සිට රාජ්‍ය සංස්ථා වෙත ණය විතැන් කිරීම නිසා උද්ගතව ඇති තොරතුරුමය ගැටළු පිළිබඳ විග්‍රහාත්මක පිළිබිඹුවක් පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සහ මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොල යන ව්‍යාපෘති සඳහා ලබාගෙන ඇති ණය වාර්තා කර ඇති ආකාරයෙන් ලැබේ. මෙකී ණය මුලදී නිසි ලෙස මධ්‍යම රජයේ ණය ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, 2014 වසරේදී එකී ණයවලට අදාළ නොපියවූ ශේෂයන් මහා භාණ්ඩාගාරයේ (මධ්‍යම රජයේ පොත්වල) සිට රාජ්‍ය සංස්ථා කිහිපයක් වෙත විතැන් කර තිබේ.

පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය ලංකා විදුලිබල මණ්ඩලයටද, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය ශ්‍රී ලංකා වරාය අධිකාරියටද, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සඳහා ලබාගෙන ඇති ණය ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමටද විතැන් කර ඇත (ඇමිණුම 1 බලන්න). සැබෑ සමස්ත රාජ්‍ය විදේශ ණයෙහි කිසිදු වෙනසක් සිදු නොවුවද මෙම විතැන් කිරීම් වල ප්‍රතිපලයක් ලෙස මධ්‍යම රජයේ විදේශ ණය අඩු අගයක් ලෙස දැක්වීමට හැකි විය මෙය වනාහි ණය ප්‍රමාණය අඩු වී ඇති ලෙස දිස් වන පරිදි සිදු කරන ලද ගිණුම්කරණ ප්‍රයෝගයකි.[6]

[6] මුදල් අමාත්‍යාංශය, 'වාර්ෂික වාර්තාව 2014', පිටු 146, 276 හා 302, available at: http://treasury.gov.lk/documents/10181/12870/2014/a9d95930-b101-40dc-9b1b-cd1ebb2a82ba [අවසන් වතාවට ප්‍රවේශය 13 ඔක්තෝබර් 2020].

### *3.2 ණය වාර්තාකරණයේ දුර්වලතා: පොතකින් පොතකට මාරු කිරීමේදී අස්ථානගත වූ ණය*

විශේෂයෙන්ම හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජාතික විගණන අධිකාරිය සඳහන් කරන්නේ 2017 වසරේදී ඊට අදාළ ණය නැවතත් මහා භාණ්ඩාගාරයේ ගිණුම් පොත් වෙත විතැන් කර ශ්‍රී ලංකා වරාය සංවර්ධන අධිකාරියේ පොත්වලින් එය ඉවත් කරන ලද බවයි.[7] ජාතික විගණන අධිකාරියේ ප්‍රකාශයට පරස්පරව 2019 වසර සඳහා වූ සිය වාර්ෂික වාර්තාවෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එය ගෙවීමට නියමිතව ඇති නොපියවූ ණයක් ලෙස වාර්තා කරමින් එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වගකීමක් ලෙස ලැයිස්තුගත කර තිබේ. කෙසේ වෙතත්, මේ වන විට මෙම ණය මධ්‍යම රජයේ පොත්වල මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත්වලද දක්නට නොලැබේ (ඇමිණුම 2 බලන්න).[8]

ශ්‍රී ලංකාවේ විගණකාධිපතිගේ වාර්තා තුලින් ද සැකසාංකා වලට තුඩු දෙන කරුණක් ඉස්මතු වේ. එම වාර්තා මඟින් පෙන්වා දෙන්නේ නෛතික වගකීම් වලට බලපාන අවස්ථාවලදී පවා මුදල් අමාත්‍යංශය ණය ගණනය කරන සහ වාර්තා කරන ආකාරයේ සැලකිය යුතු ප්‍රමාද දෝෂයන් දැකිය හැකි බවයි. ණය මධ්‍යම රජයේ පොත්වල සිට රාජ්‍ය සංස්ථා පොත් වෙතද, රාජ්‍ය සංස්ථා පොත්වල සිට මධ්‍යම රජයේ පොත් වෙතද මාරු කිරීමේදී සිදු වන අස්ථානගතවීම් මගින් ණය අවගණනය කිරීමකට ලක් වන බව මෙම උදාහරණයෙන් පැහැදිලි වේ.

## 4. නිගමනය

චීනයට අදාළ ශ්‍රී ලංකාවේ ණය තත්ත්වය පිළිබඳ ඇගයීම නිදසුනක් ලෙස ගෙන ණය වාර්තාකරණ රාමුව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව මෙම සංක්ෂිප්ත සටහනෙන් අවධාරණය කෙරේ. මෙහිදී චීනයට අදාළ සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සැලකිය යුතු කොටසක් රාජ්‍ය සංස්ථා සතුව පවතින අතර රාජ්‍ය ණය සම්බන්ධයෙන් සිදුවන වත්මන් වාර්තාකරණය තුළ ඒ පිළිබඳ හෙළි කිරීමක් සිදු නොවේ.

ණය කළමනාකරණය සම්බන්ධයෙන් අතිශයින්ම අභියෝගාත්මක කාල වකවානුවකට අවතීර්ණ වීමට ශ්‍රී ලංකාව සූදානම් වන සන්දර්භයක සැබෑ ණය තත්ත්වය හා ණයෙහි ස්වභාවයන් වඩා හොඳින් පිළිබිඹු වන පරිදි ණය වාර්තාකරණය වැඩිදියුණු කිරීම යනු විසඳුම් ලබාගත හැකි මගක් වෙත ප්‍රවිශ්ඨ වීමේ ඉතා වැදගත් පළමු පියවරකි.

---

[7] ජාතික විගණන අධිකාරියට අනුව මෙම ණය විතැන් කිරීම සිදු කර ඇත්තේ ‘‘හම්බන්තොට වරාය සහන ගිවිසුම’ නමැති 2017 ජූලි 20 දිනැති අංක MPS/SEC/2017/32 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුකූලව වේ. ඊට අදාළ කැබිනට් මණ්ඩල අනුමැතිය 2017 අගෝස්තු 04 දින ලබා දෙන ලදි.

[8] Ministry of Finance Sri Lanka (MoF), ‘Annual Report 2019: Report of the Auditor General on the Financial Statements of the Government for the year ended 31st December 2019’, Section 1.6.2.1 (a) (ii), available at: http://treasury.gov.lk/documents/10181/12870/Annual+Report+2019-20200625-rev2-eng/5952fd01-ba62-4186-a270-fe87fd87fd5c [last accessed 13 October 2020].

## ඇමිණුම 1: 2014 වාර්ෂික වාර්තාවට අනුව මධ්‍යම රජයේ සිට රාජ්‍ය සංස්ථා වෙත ණය මාරුකිරීම්

10 | FINANCIAL STATEMENTS

### Explanatory Notes

**Note 10 - Vehicles on Lease**

In terms of the Budget Circular No 150, the Department of National Budget has procured 2,519 motor vehicles and 21,498 Motorcycles on Lease in 2014 and a sum of Rs. 1,839,590,000 has been paid as lease installments during the year which included under the Object code No 2101-Acquisition of Vehicles.

**Note 30.1 - Disposal of Movable Assets**

Disposal of Movable Assets in the reporting period is disclosed in the Financial Statements of the following year.

**Schedule I - Expenditure Committed in 2013 and Paid in 2014**

The total expenditure incurred during the year 2014, represents recurrent expenditure of Rs. 27,478 million and Capital expenditure of Rs. 44,922 million, related to the reporting period of 2013.

**Schedule II - Total Revenue and Expenditure of Provincial Councils**

Total Revenue of Rs. 59,979,015,473 and Total Expenditure of Rs. 195,782,311,048 were reported for 9 Provincial Councils. (Provincial amounts)

**Investment in Physical Assets**

The detailed information on public investment in physical assets, both in terms of foreign and local funds, for the period from 2005 - 2014, amounts to Rs. 2,576,199 million, which covers around 75% of the same being a significant capital formation, is provided in a separate report.

**Loans Transferred from Debt Stock**

Following loan balances have been transferred from debt stock to relevant public enterprises.

| Loan key No. | Institution | Project | Amount (Rs.) |
|---|---|---|---|
| 2005045 | Ceylon Electricity Board | Puttalam Coal Power Project | 32,762,150,000 |
| 2007044 | Sri Lanka Ports Authority | Hambantota Port Development Project | 31,206,345,802 |
| Total | | | 63,968,495,802 |

**ණය තොගයෙන් මාරු කරන ලද ණය**

පහත දැක්වෙන ණය ශේෂයන් ණය තොගයෙහි සිට අදාළ රාජ්‍ය ව්‍යවසායයන් වෙත මාරු කරන ලදි.

| ණය අංකය | ආයතනය | ව්‍යාපෘතිය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2005045 | ලංකා විදුලිබල මණ්ඩලය | පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය | 32,762,150,000 |
| 2007044 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 31,206,345,802 |
| එකතුව | | | 63,968,495,802 |

*මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාව 2014*

**NOTE - 28 (I) - STATEMENT OF FOREIGN LOAN BALANCES** (Rs.)

| Name | Loan Key | Balance as at 01.01.2014 (8343) | Accounted during the year | Repayments | Parity | Closing Balance as at 2014.12.31 (8343) |
|---|---|---|---|---|---|---|
| **Danske Bank** | | | | | | - |
| Towns South of Kandy Water Supply Project | 2006072 | 4,466,660,694 | | 750,559,787 | (446,783,142) | 3,269,317,765 |
| **Exp. Development Bank of Iran** | | | | | | - |
| Uma Oya Hydro Electric and Irrigation Project | 2008027 | 6,618,625,856 | | | 14,963,066 | 6,633,588,922 |
| Implementation of Rural Electrification Project 8 | 2010005 | 5,726,897,959 | | | (667,466,659) | 5,059,431,300 |
| **Exp. Imp. Bank of China** | | | | | | - |
| Muthurajawela Oil Tank Farm Project | 2001079 | 2,206,265,577 | | 733,575,327 | 1,478,684 | 1,474,168,934 |
| Hambantota Port Development Project | 2007044 | 32,073,358,419 | - | - | (867,012,617) | |
| Bunkering Facility & Tank Farm Project at Hambantota | 2009009 | 7,739,139,898 | 770,609,177 | 385,201,189 | 18,244,263 | 8,142,792,149 |
| Colombo - Katunayake Expressway (CKE) Section A2 | 2009010 | 8,312,466,974 | | 690,966,308 | 15,487,111 | 7,636,987,778 |
| Colombo - Katunayake Expressway (CKE) Section A1 | 2009011 | 9,158,139,838 | | 761,262,101 | 17,062,701 | 8,413,940,438 |
| Colombo - Katunayake Expressway (CKE) Section A3 | 2009012 | 6,249,602,639 | | 519,539,661 | 11,644,807 | 5,741,707,785 |
| Colombo - Katunayake Expressway (CKE) Section A4 | 2009013 | 8,732,118,688 | | 725,849,476 | 16,268,971 | 8,022,538,182 |
| Puttalam Coal Power Project Phase II | 2009027 | 2,601,274,669 | - | - | (2,601,274,669) | - |
| Mattala Hambantota International Airport Project | 2010006 | 1,356,473,947 | - | | (1,356,473,947) | - |
| Supply of 13 Nos. Diesel Multiple Units to Sri Lanka Railway Project | 2010007 | 8,495,630,292 | 5,405,023,262 | - | (277,046,405) | 13,623,607,149 |
| Supply of 2 Nos. MA60 Aircraft Project | 2010029 | 5,698,868,345 | | - | (113,581,062) | 5,585,287,283 |
| Procurement of Material for the Northern Province Power Sector Development Programme | 2010030 | 2,842,893,240 | 1,170,009,027 | 199,937,051 | 10,994,582 | 3,823,959,798 |
| Northern Road Rehabilitation Project (A009) from Galkulama to 230 km post | 2010031 | 8,534,908,185 | 746,054,417 | 385,031,708 | 18,441,387 | 8,914,372,280 |
| Northern Road Rehabilitation Project - 11B | 2010032 | 4,186,985,235 | 1,370,408,895 | - | 13,442,542 | 5,570,836,672 |
| Northern Road Rehabilitation Project - (Mulativu - Kokkilai) 11A | 2010033 | 4,248,401,550 | 1,342,234,679 | 231,990,596 | 12,471,829 | 5,371,117,463 |
| Northern Road Rehabilitation Project - (AB020) (AB032) (AB016) (AB018) | 2010034 | 6,964,423,102 | 2,805,628,933 | 405,521,212 | 24,505,735 | 9,389,036,557 |
| Northern Road Rehabilitation Project A009 (from 230km to Jaffna) | 2010035 | 8,857,598,463 | 361,676,950 | 382,480,730 | 18,516,539 | 8,855,311,222 |
| Highway Section Pinnaduwa to Kodagoda (30km to 45km) | 2011005 | 4,191,146,977 | 847,396,829 | - | 13,001,552 | 5,051,545,358 |
| Highway Section Kodagoda to Godagama (45km to 61km) | 2011006 | 4,758,223,239 | 1,146,614,596 | - | 14,379,931 | 5,919,217,766 |
| Rehabilitation & Improvement of 67 km Length of Navatkuli, Karaitivu, Mannar Road | 2011008 | 2,565,715,677 | 2,996,716,473 | - | 15,179,057 | 5,577,611,207 |
| Rehabilitation & Improvement of 113 km Length of Puttalam Marichchikade, Mannar Road | 2011009 | 2,153,260,884 | 3,278,813,431 | | 13,883,360 | 5,445,957,675 |
| Finance Material Required for Lighting Sri Lanka Eastern Province Project | 2012001 | 1,818,136,179 | 2,088,051,287 | | 12,893,778 | 3,919,081,244 |
| Hambantota Port Development Project Phase ii | 2012033 | 757,875,668 | - | - | (757,875,668) | - |
| Matara - Beliatta Section of Matara - Kataragama Railway Line Extension | 2013005 | 3,200,000,000 | 10,162,395,550 | | 34,697,751 | 13,397,093,301 |
| Hambantota Port Development Project Phase I for Ancillary Work and Supply of Equipment Project | 2013014 | | | | | |
| Greater Kurunegala Water Supply and Sewerage Project | 2013041 | | 762,863,668 | | (53,517,058) | 709,346,610 |

10 | FINANCIAL STATEMENTS

**Notes to Financial Statements** *contd...*

*මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාව 2014*

**ඇමිණුම 2: හම්බන්තොට වරාය ව්‍යාපෘති ණය පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව**

(ii) හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගනු ලැබ ඇති ණයවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 172,717 ක් විය. මේ සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අංක MPS/SEC/2017/32 හා 2017 ජූලි 20 දිනැති "හම්බන්තොට වරාය සහන ගිවිසුම" නම් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017 අගෝස්තු මස 04 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව, හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ණය වලින් තවදුරටත් ගෙවිය යුතුව ඇති ශේෂය ආපසු ගෙවීමේ වගකීම, එකී සහන ගිවිසුම බලාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරය විසින් භාර ගෙන තිබූ නමුදු, එම ණය ශේෂය රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එසේම, එම ණය ශේෂය වරාය අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවලින්ද ඉවත්කර තිබුණි.

*මූලාශ්‍රයː මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාව 2019*